චක්‍රලේඛ අංක :54/2005

මගේ අංකය:- දපස/නි/චක්‍ර
දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව,
අංක 07- බලදක්ෂ මාවත,
ගාල්ල.
2005.03.07.

දකුණු පළාතේ සියලුම සමුපකාර සමිතිවල,
සභාපතිවරුන් වෙත.

## දකුණු පළාත් සමුපකාර සේවක වැටුප් ප්‍රතිශෝධනය
## - 2005 -

1998 අංක 01 දරණ දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 11(1) 'ඇ' වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සමුපකාර සේවක කොමිෂන් සභාවේ නිර්දේශිත වැටුප් ලබන ස්ථිර, තාවකාලික, අනියම් හා දෛනික සේවකයින්ගේ වැටුප් 2005.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රු.1250/= කින් වැඩි කිරීමට තීරණය කර ඇති බව දන්වමි.

02. ඒ අනුව 2004.12.31 වන දිනට ක්‍රියාත්මක ව පැවති 1997.12.10 දිනැති අංක 30/97 සහ 2004.02.09 දිනැති අංක 51/2004 දරණ දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛණ වල සඳහන් වැටුප් වෙනුවට 2005.01.01 වන දින සිට ක්‍රියාත්මක වන නව වැටුප් පරිමාණය (මාසික) ඇතුලත් ලේඛණයක් මේ සමඟ යවා ඇත.(ඇමුණුම 1).

03. මෙම රු.1250/= ක වැටුප් ප්‍රතිශෝධනය 2000.07.17 දිනැති අංක 38/2000, 2002.06.23 දිනැති අංක 44/2002, 2003.05.08 දිනැති අංක 50/2003 දරණ දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ වලින් හඳුන්වා දී ඇති තනතුරු දරන්නන් සඳහාද, 2005.01.01 වන දින සිට ගෙවිය යුතුය.

04. මීට අතිරේකව දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කොට ඇති 2000.08.21 දිනැති අංක 39/2000 දරණ චක්‍රලේඛයේ සඳහන් රු.400/= ක අතුරු දීමනාවද, 2001.11.19 දිනැති අංක 43/2001 දරණ චක්‍රලේඛණයේ සඳහන් රු.1000/= ක අතුරු දීමනාවද, තවදුරටත් එලෙසම ගෙවිය යුතුය.

05. සියලුම ව්‍යවස්ථාපිත හිමිකම් සඳහා මෙම නව වැටුප් ක්‍රමය අදාල කර ගත යුතු අතර, දැනට ගෙවනු ලබන සංයුක්ත දීමනාවේ කිසිදු වෙනසක් නොවිය යුතුය. 2005.01.01 වන දිනෙන් අනතුරුව විශ්‍රාම යන හෝ ඉල්ලා අස්වන සේවකයින්ට පාරිතෝෂික දීමනා ගෙවීමේදී නව වැටුප් ක්‍රම සහ දීමනා අනුව ගණන් බැලිය යුතුය. 2005.01.01 වන දිනෙන් පසුව විශ්‍රාම ගොස් හෝ ඉල්ලා අස්ව ඇති සේවකයින්ටද නව වැටුප් අනුව වැටුප ප්‍රතිශෝධනය කර අදාල හිඟ වැටුප් ගෙවිය යුතුය.

................/02

06. සමූපකාර සේවක කොමිෂන් සභාවේ නිර්දේශිත වැටුප් නොලබන සේවක/සේවිකාවන්ට මෙම වැටුප් ප්‍රතිශෝධනයට හිමිකමක් නොමැත. එහෙත් ඔවුන්ගේ වැටුප් අදාල ව්‍යවස්ථාපිත ආයතනවලින් සංශෝධනය කර ප්‍රතිඥා කරන තෙක් කොන්දේසියකට යටත් කර ගිවිසුමකට එළඹ රු.1250/= ක මුදල මාසික දීමනාවක් ලෙස ගෙවිය හැකිය.

07. තවද, සමූපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 2003.02.17 දිනැති අංක 48/2003 දරන චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන පරිදි කොන්ත්‍රාත් පදනම යටතේ සේවයේ යොදවා සිටින සේවකයින්ටද, මෙම රු.1250/= ක මුදල දීමනාවක් ලෙස ගෙවිය යුතුය.

08. ඔබ සමිතියේ සියලුම සේවකයින්ට මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන දැනගැනීමට සැලැස්විය යුතුය. යම් අනනුරූප වැටුප් ගැන ගැටලුවක් මතුවේ නම්, කොමිෂන් සභාවෙන් විමසා උපදෙස් ලබා ගත යුතුය.

09. මෙම වැටුප් ක්‍රමය ඇතුලත් කර ලිපියක් සේවකයින්ට නිකුත් කළ යුතු අතර, එහි පිටපතක් ඔවුන්ගේ පුද්ගලික ලිපි ගොනුවේද ඇතුලත් කළ යුතුය.

10. මෙම චක්‍රලේඛය දකුණු පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්ගේ එකඟතාවය ඇතිව නිකුත් කරන ලදී.

(සුනිපාල මාපලවත්ත),
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත්:- 1. ආ.ස.ලේ. - ද.ප.
2. ස.සං.කො/රෙ - ද.ප.
3. පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන් වෙත.
4. අදාල ගොනුවට.

දේ/07.

ඇමුණුම (I)

54/2005 දරණ චක්‍රලේඛනයේ 02 වන ඡේදයේ සඳහන් වැටුප් පරිමාණය.

| 2004.12.31 වන දිනට ගෙවනු ලැබූ වැටුප් පරිමාණය (මාසික) | 2005.01.01 වන දින සිට ක්‍රියාත්මක නව වැටුප් පරිමාණය(මාසික). |
|---|---|
| 01. 7700-225x4-300x4-9800 | 8950-225x4-300x4-11050 |
| 02. 6700-200x4-250x4-8500 | 7950-200x4-250x4-9750 |
| 03. 5600-150x4-200x4-7000 | 6850 -150x4-200x4-8250 |
| 04. 5300-150x4-200x4-6700 | 6550-150x4-200x4- 7950 |
| 05. 4900-100x6-150x6-6400 | 6150-100x6-150x6-7650 |
| 06. 4500-100x6-150x6-6000 | 5750-100x6-150x6-7250 |
| 07. 4200-100x6-150x6-5700 | 5450-100x6-150x6-6950 |
| 08. 4000-70x5-125x10-5600 | 5250-70x5-125x10-6850 |
| 09. 3700-70x5-125x10-5300 | 4950-70x5-125x10-6550 |
| 10. 3600-60x5-75x10-4800 | 4850-60x5-75x10-6050 |
| 11. 3400-55x6-70x11-4500 | 4650-55x6-70x11- 5750 |
| 12. 3350-40x6-60x11-4250 | 4600-40x6-60x11- 5500 |
| 13. 3250-40x6-50x12-4000 | 4500-40x6-50x12- 5250 ✓ 5340 |
| 14. 3200-30x6-45x12-3920 | 4450-30x6-45x12- 5170 |
| 15. 3100-30x6-45x12-3820 | 4350-30x6-45x12-5070 |
| 16. 3050-25x6-35x12-3620 | 4300-25x6-35x12-4870 |
| 17. 3000-25x6-35x12-3570 | 4250-25x6-35x12-4820 |